# ICBS 04

## බෞද්ධ *බ්‍රහ්මදණ්ඩනයෙන්* ඉදිරිපත් කෙරෙන ප්‍රතිසංස්කරණවාදී එළඹුම පිළිබඳ ආචාරවිද්‍යාත්මක අධ්‍යයනයක්

**Ven. Gonalagoda Nanda[1] R.M.P.G.N.K. Wijesuriya[2]**
*[1]Bhiksu University of Sri Lanka, Anuradhapura*
*gonalagodananda@gmail.com*
*[2] Sri Lanka International Buddhist Academy, Pallekele*
*nishanranawana@gmail.com*

බෞද්ධ *බ්‍රහ්මදණ්ඩණය* ප්‍රතිසංස්කරණවාදී එළඹුම හා සමපාත වන්නේ ද? යන ගැටලුව මුල් කරගනිමින් සංධාර පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කෙරෙන මෙම අධ්‍යයනයෙහි අරමුණ වනුයේ *බ්‍රහ්මදණ්ඩනයෙන්* ගම්‍ය වන නූතන උපයෝගිතාව පිළිබඳ විමසීමයි. නීතියක් හෝ වැරදි යැයි සම්මත යමක් කඩ වූ කල්හි හික්මවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය දඬුවම වේ. ඒ අනුව වරදකරුවකු හික්මවීම සඳහා දඬුවම භාවිත කෙරේ. කායික දණ්ඩනය හා මානසික දණ්ඩනය වශයෙන් දඬුවම අංශද්වයකින් යුක්තය. *දණ්ඩනය* හා සම්බන්ධ බෞද්ධ අදහස වර්ධනය වනුයේ බුද්ධත්වයෙන් මුල් විසිවසින් පසුවය. *බ්‍රහ්මදණ්ඩනය* බෞද්ධ දඬුවමෙහි උපරිම අවස්ථාවකි. එය අවස්ථා තුනක දී දැනුවත් කර සිදුකරනු ලබයි. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ඡන්න භික්ෂුවට *බ්‍රහ්මදණ්ඩනය* පනවන ලෙස අනුදැන වදාරා ඇත්තේ බුදුරජාණන් වහන්සේ විසිනි. බ්‍රහ්මදණ්ඩනයෙහි කායික හා මානසික යන උභය *දණ්ඩන* ක්‍රම අන්තර්ගතය. එහි දී දඬුවම ක්‍රියාත්මක වීමට පෙර වරදකරු මානසික දඬුවමක් විඳින අතර දඬුවම ක්‍රියාත්මක වීමෙන් පසු ව කායික දඬුවම ආරම්භ වේ. එය ද යම් කාලයක දී අවසන් කළ යුතු වේ. මේ අනුව ගම්‍ය වනුයේ දඬුවම බුදුදහම තුළ ප්‍රතික්ෂේප නො වන බවයි. එහෙත් බෞද්ධ දඬුවමෙහි අරමුණක් පවතී. එනම් ප්‍රතිසංස්කරණයයි. වරද, වරද වශයෙන් දැන අවශ්‍ය මානත් පූරණය කළ පසු එම දඬුවමින් මුදා හැරේ. දඬුවම භාවිත කර ඇත්තේ පුද්ගලයාගේ වරද නිවරද කොට චරිත විශෝධනය කිරීමටය. සදාචාර දර්ශනයෙහි දඬුවම සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් සාකච්ඡා කෙරෙනුයේ ප්‍රතිඵලාත්මකවාදය, නීවරණාත්මකවාදය, උපයෝගිතාවාදය සහ ප්‍රතිසංස්කරණවාදයයි. ප්‍රතිඵලාත්මකවාදයෙන් වරදෙහි ප්‍රමාණය අනුව ඒ සමාන දඬුවමක් ද නීවරණාත්මකවාදයෙන් සමාජයට සුසමාදර්ශයක් ලබාදීම ද උපයෝගිතාවාදයෙන් වරදින් සිදුවන අලාභය පියවා ගැනීම ද සඳහා දඬුවම් පමුණුවනු ලැබේ. වරදකරුට යම් දඬුවමක් නියම කර චරිත ශෝධනයට ලක්කිරීම ප්‍රතිසංස්කරණවාදයෙන් සිදුවේ. වරදක් සිදුවුවහොත් දඬුවමක් තිබිය යුතුය. එහෙත් දඬුවම අන්තගාමී ව පුද්ගලයාට නිවැරදි වීමට අවස්ථාවක් නො දී පවතින්නේ නම් එම දඬුවමෙහි ප්‍රතිඵලයක් නොමැත. එබැවින් *බ්‍රහ්මදණ්ඩනය* පිළිබඳ බෞද්ධ විග්‍රහය ප්‍රතිසංස්කරණවාදී එළඹුම හා සමාන වේ. මේ අනුව ගම්‍ය වනුයේ *බ්‍රහ්මදණ්ඩනයෙන්* ප්‍රකට වන ප්‍රතිසංස්කරණවාදී එළඹුම නූතන උපයෝගිතාවෙන් යුක්ත බවයි.

**ප්‍රමුඛ පදඃ** චරිත විශෝධනය, දඬුවම, වරද, සදාචාරය